ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය - 2010

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1:1 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ1:2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1:2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1:2:1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 10 (4) වගන්තිය ප්‍රකාරව, එක් එක් මුදල් වර්ෂයේ ගිණුම්, එම මුදල් වර්ෂය අවසන් වී එක් මාසයක් ඇතුලත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවත්, 2010 වර්ෂයේ ගිණුම් විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2011 මැයි 05 වන දිනය.

1:2:2 **නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති,රීති ,රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(අ) <u>මුදල් රෙගුලාසි</u>** | |
| (I) මු.රෙ 135 | මූල්‍ය බලතල පවරා එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (II) මු.රෙ 452(1 | විගණන විමසුම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |

| | |
|---|---|
| (III) මු.රෙ 756 හා 757 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කොට, සමීක්ෂණ වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (IV) මු.රෙ 880 හා 881 | ඇප තැබීම් සිදුකළ යුතු නිලධාරීන් ඇප තබා නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 වගන්තිය | අනුමත සේවක සංඛ්‍යාව හා සංවිධාන සැලැස්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොකිරීම හා විස්තරාත්මක තොරතුරු ඇතුලත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් නොවීම. |
| (ඇ) 2004 පෙබරවාරි 24 දිනැති 61/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 6.1වගන්තිය | ගිණුම් වර්ෂය අවසාන වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ වැඩ කටයුතුවලින් රු. 1,135,490 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,099,817ක වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. 35,673 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්ය සාධනය

ආයතනයේ මුළු කාර්ය මණ්ඩලය 5 දෙනෙකු වූ අතර, සමාලෝචිත වර්ෂය තුල දරා තිබුණු මුළු පුනරාවර්ථන වියදම රු.6,503,141ක් විය. විනිශ්චයකාරවරුන් පුහුණු කිරීමේ වැඩ සටහන් 17ක් සහ සම්මන්ත්‍රණ 33ක් පවත්වා තිබුණි.

#### 2.2.2 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි 02 දිනැති හා අංක පඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1,2 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) මූල්‍ය බලතල පැවරීම

(ආ) ගෙවීම් අනුමත කිරීම

(ඇ) භාණ්ඩ සමීක්ෂණය